පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.06 පැය 1730 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 24 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**TELL IGP (පොලිස්පතිට කියන්න) සහ I-need සේවාව නව මුහුණුවරකින් එළිදැක්වීම.**

ශ්‍රී ලංකා පොලිසිය මහජනතාව වෙත වඩාත් සමීපව කටයුතු කිරීමට හා ඔවුන්ගේ ගැටළු සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම අරමුණු කර ගනිමින් කටයුතු කිරීමේ ව්‍යාපෘතියක් ලෙස TELL IGP (**පොලිස්පතිට කියන්න**) පෙන්වා දිය හැකි අතර මෙම ව්‍යාපෘතිය හරහා මහජනතාවගේ පැමිණිලි, අදහස් හා යෝජනා සෘජුවම පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කිරීමේ හැකියාව සලසා දී තිබුණි.

එසේම TELL IGP සේවාව මගින් පොලිස්පති තුමාගේ අවධානයට සෘජුවම යොමු කල යුතු කරුණු, පොලිස් ස්ථානයන් මගින් විමශර්න සිදු නොවන පැමිණිලි හා පොලිස් නිලධාරින් සිදුකරන වැරදි සම්බන්ධයෙන් පැය 24 පුරා පැමිණිලි කල හැකි අතර එම පැමිණිලි කඩිනමින් විමශර්නය කර අවශ්‍ය ක්‍රියාමාගර් ගැනීමට කටයුතු කරනු ලබයි.

I-need සේවාව මඟින් ජංගම දුරකථනයක් අස්ථාන ගතවූ අවස්ථාවකදී පොලිසියට නොගොස් Online මාගර්යෙන් අස්ථාන ගතවූ දුරකථනයේ තොරතුරු ලබාදී පැමිණිල්ලක් යොමු කිරීමේ හැකියාව ලබාදී තිබූ අතර, අස්ථාන ගතවූ දුරකථනයක් යම් පුද්ගලයෙකු විසින් භාවිතා කරයි නම් ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරු වෙත මෙම සේවාව හරහා දැනුම් දීම සිදුකරනු ලබයි.

එසේම, මෙම සේවාවන් වෙත www.police.lk නිල වෙබ් අඩවියට ගොස් E-Services ඔස්සේ TELL IGP හා I-need සේවාව වෙත පිවිසිය හැකි අතර පැය 24 පුරා පැමිණිලි කිරීමේ හැකියාව ඇත.

TELL IGP (**පොලිස්පතිට කියන්න**) සහ I-need සේවාව නව මුහුණුවරකින් කායර්ක්ෂමව මහජනතාවගේ ගැටළු, පැමිණිලි සඳහා ප්‍රතිචාර දැක්වීමට හැකියාවක් ලැබෙන පරිදි නවීකරණය කර එළි දැක්වීම 2025.01.06 වන අද දින වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා විසින් පොලිස් මූලස්ථානයේදී සිදු කරන ලදී.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප


POLICE
Reserved
CRD
SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE
Follow Us


SRI LANKA POLICE
CRD
SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE




**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**